# 18. ඇත්ත කතා කරමු

පැමිණීමේ නාම ලේඛනය ලකුණු කළ ගුරුතුමා, ඊට පෙර දිනයේ පාසලට නොපැමිණි ළමුන් කැඳවී ය.

ගුරුතුමා : ඊයේ පාසලට ආවේ නැති අය ඉස්සරහට එන්න.
(බෂීර් ඉදිරියට එයි.)

ගුරුතුමා : බෂීර්, ඇයි ඔයා පාසලට ආවේ නැත්තේ?



| | | |
|---|---|---|
| බෂීර් | : | (හේතුව කියන්නට බැරිව ළතැවෙයි) |
| ගුරුතුමා | : | අසනීප වුණා ද? |
| බෂීර් | : | ("නැහැ" කියා හිස වනයි) |
| ගුරුතුමා | : | භෝජන සංග්‍රහයකට ගියා ද? |
| බෂීර් | : | ("නැහැ" කියා හිස වනයි) |
| ගුරුතුමා | : | හේතුව කියන්න. |
| බෂීර් | : | සර්, මට සමාවන්න, හේතුවක් නැතිවයි ආවේ නැත්තේ. |
| ගුරුතුමා | : | ඇත්ත කිවූ නිසා මා ඔබට සමාව දෙනවා. මීට පස්සෙ හේතුවක් නැති ව පාසලට එන්නෙ නැති ව ඉන්න එපා. |
| බෂීර් | : | හොඳමයි සර්. |
| | | (සීනුව නාද වෙයි. ගුරුතුමා පන්තියෙන් පිට වී යයි. කාසිම් සහ රෂීඩ් දෙදෙනා බෂීර් ළඟට පැමිණේ.) |
| කාසිම් | : | ඔබට බොරුවක් කියන්න තිබුණා නේ ? |

බෂීර් : මම බොරු කියන්නේ නැහැ. තිත්ත වුණත් ඇත්ත කතා කරන්න කියලා ඉස්ලාමයේ කියලා තියෙනවා. ගුටි කෑවත්, ඇත්ත කතා කරන්න කියලා, මගේ තාත්තා උගන්නලා තියෙනවා.

සලීම් : අබ්දුල් කාදර් ජීලානිතුමාත් හොරු කණ්ඩායමට ඇත්ත කියලා, තමා ළඟ තිබුණු රන් කාසි ඉදිරියට දැම්මාලු නේ ද?

කාසිම් : බෂීර් හොඳ ම යහළුවෙක්. ඇත්ත කතා කරලා එඩිතර ව ඉන්නවා. අපත් මීට පස්සේ ඇත්ත කතා කරන අය වෙන්න ඕන.

## පැවරුම්

1. නිවැරැදි වාක්‍ය ඉදිරියෙන් හරි "✓" ලකුණ යොදා අභ්‍යාස පොතේ ලියන්න.
   1. අපි හැම විට ම ඇත්ත කතා කරමු.
   2. බොරු කීම හොඳ පුරුද්දකි.
   3. වැරැදිවලට සමාව දීම හොඳ පුරුද්දකි.
   4. ඇත්ත කතා කළොත් සමාව ලැබේ.
   5. අප දිනපතා පාසලට පැමිණිය යුතුයි.

2. ඔබ ඇත්ත කතා කිරීමෙන් අත්වුණු යහපත ගැන වාක්‍ය පහක් ලියන්න.